ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# <u>පුවත්පත් නිවේදනය</u>

## <u>ඉන්දියානු ඩයස්පෝරා තරුණ තරුණියන් සඳහා Know India වැඩසටහන</u>

ඉන්දියානු රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය 66 වන සහ 67 වන **Know India (KIP) වැඩසටහන** සඳහා පහත සඳහන් පරිදි අපේක්ෂිත දින නිවේදනය කර ඇත.

| | අපේක්ෂිත දින | සහකාර ප්‍රාන්තය | මාර්ගගත (online) අයදුම්පත් සඳහා අවසාන දිනය |
|---|---|---|---|
| 66 වන KIP | 2023 ජූලි 30 සිට 2023 අගෝස්තු 18 | කේරළ | 2023 ජූනි 15 |
| 67 වන KIP | 2023 අගෝස්තු 13 සිට 2023 සැප්තැම්බර් 01 | මහාරාෂ්ට්‍ර | 2023 ජූලි 01 |

2. KIP වැඩසටහන විවිධ ක්ෂේත්‍රයන්හි දස්කම් දක්වා ඇති සහ ඉන්දියාව පිළිබඳ මහත් උනන්දුවක් පෙන්නුම් කර ඇති සහ මව්පිය උරුමයෙන් ඉන්දියාව සමඟ සබඳතා සහිත වයස අවුරුදු 18-30 අතර විදේශගත ඉන්දියානුවන්ට (අනේවාසික ඉන්දියානුවන් හැර) විවෘත ය.

3. ලොව පුරා ඉන්දියානු ඩයස්පෝරා තරුණ තරුණියන් සිය මාතෘ භූමිය සමඟ සම්බන්ධ කිරීමේ අරමුණින් දියත් කරන වැඩසටහනක් වේ. තෙසතියක මෙම වැඩසටහන සමකාලීන ඉන්දීය ජන ජීවිතයේ විවිධ පැතිකඩ පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

4. තෝරා ගන්නා තරඟකරුවන් සඳහා මෙම දින 21ක වැඩසටහන තුළ දී ඉන්දියාවේ දේශපාලන පද්ධතිය, ආර්ථිකය, සමාජය සහ විවිධ ප්‍රධාන අංශවල වර්ධනයන් පිළිබඳව දැනුම ලබා දෙනු ඇත. එසේම, ඓතිහාසික සහ සංස්කෘතික වැදගත්කමකින් යුත් ස්ථාන වෙත සිදුකරන සංචාර හරහා ඉන්දියාවේ ඉතිහාසය සහ උරුමය පිළිබඳව අවබෝධයක් ලබා දෙනු ඇත. තව ද KIP වැඩසටහන අතරතුර විවිධ ක්ෂේත්‍රවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ වෘත්තිකයන් සමඟ අන්තර්ක්‍රියා, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ නායකයන් සමඟ හමු යනාදිය ද වෙනම ම සංවිධානය කර තිබේ. ඉන්දියාවේ ප්‍රාන්ත එකකට හෝ කිහිපයකට සිදු කරන දින 7-10ක සංචාරයක් ද මෙම වැඩසටහනට ඇතුළත් වේ.

5. වැඩසටහන අතරතුර සියලු වියදම්වලට අමතරව යාමට සහ ඒමට ගුවන් ටිකට් පතෙන් 90%ක් ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් දරනු ලබයි. මේ සඳහා උනන්දුවක් දක්වන තරඟකරුවන් අවසාන දිනට පෙර www.kip.gov.in වෙබ් අඩවිය හරහා ලියාපදිංචි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

***

කොළඹ
2023 මැයි 25